- ***ඇමරිකාව වියරු වැටී ඇත්තේ  බහු කේන්ද්‍රීය ලෝකයක ඩොලරය වෙනුවට "යුවානය හා රූබලය" ශක්තිමත් වන පසුබිමකයි..***

- ***අද තියෙන්නේ යුද්ධෙ පාවිච්චි කරලා සුද්දෙ හොඳටම කරන ආණ්ඩුවක්..  ආවේ නම් සුද්දෙ නැති කරන්න***

අපේ රටට බලපෑ යුධ සමයන්හිදී ඉරානය නිරතුරුව මිතුරෙකු ලෙස අපි පසුපස රැඳී සිටිමින් අපේ රටට ජවය දුන්නා සේ ශ්‍රී ලංකාව මේ අසීරු යුද්ධයේදී පැරණි මිතුරාට ශක්තිය දෙමින් ඉරානය පසුපස සිටගත යුතු බව ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ පවසයි...

ඇමරිකාව හා ඊශ්‍රායලය එක්ව ඉරානයට පහර දෙද්දී ඉරානය සවිමත්ව ඊට මුහුණ දෙන්නේ  තනි වූ ඉරානයක් ලෙස නොව, චීනයේ රුසියාව ආදී මිත්‍ර රටවල්ද ප්‍රමුඛ  මිත්‍රත්ව සහයෝගිතා බලවේගයක් යටතේ බව  විමල් විරවංශ පවසයි.

ඉරානයට පහර දෙන අධිරාජ්‍යවාදී ආක්‍රමණිකයා අද වියරු වැටී ඇත්තේ  මෙතෙක් කලක් ඔවුන්ට අවනතව තිබූ ඒක කේන්ද්‍රීය ලෝකය  යුද්ධයත් සමගම අද බහු කේන්ද්‍රීය ලෝකයක් බවට පරිවර්තනය වෙමින් ''පෙට්‍රෝල් ඩොලරය'' වෙනුවට පෙට්‍රෝල යුවානය හෝ පෙට්‍රෝල රූබලය ටිකෙන් ටික බලගතු වෙමින් පවතින පසුබිමක බව ඔහු පෙන්වා දුන්නේය..

විමල් වීරවංශ මහතා මෙසේ අදහස් දක්වනු ලැබුවේ ඊයේ 19 වැනිදා කොළඹ පදනම් ආයතනයේදී "ලේ සහ කඳුළු ඇතුලත කතාව" යන තේමාව යටතේ පැවති සම්මන්ත්‍රණයක ප්‍රධාන දේශකයා ලෙස සහභාගි වෙමිනි. එහිදී මොහාන් සමරනායක මහතාගේ ආරම්භක දේශනයෙන් පසු විමල් වීරවංශ මහතාගේ ප්‍රධාන දේශනය සිදු විය. ඉරාන තානාපති කාර්යාලයේ නියෝජ්‍ය තානාපතිවරයා, චීන තානාපති

කාර්යාලයේ දේශපාලනාංශ ප්‍රධානී ඇතුළු විදේශ තානාපති නිලධාරීන්, සහෝදර දේශපාලන පක්ෂ නියෝජිතයන් හා සමාජ ක්‍රියාකාරීන් රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

ඉරානය ශ්‍රී ලංකාවේ ඉතා ගැඹුරු මිත්‍ර රාජ්‍යයක් බවත්, ජෙනරාල් කොබ්බෑකඩුව වැනි නායකයින් උතුරේ යුධ කටයුතු මෙහෙයවන කාලයේදී අසීරු අවස්ථාවල අප රටට උණ්ඩ හා උපකරණ ලබාදුන් බවත්, ජාත්‍යන්තරයේදී රුසියාව හා චීනය සමග එක්ව ශ්‍රී ලංකාවේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාව රැකගැනීමට සහය අනුපමේය සහායක් දුන් බවත් වීරවංශ මහතා සිහිපත් කළේය. උමා ඔය ව්‍යාපෘතිය, බියගම තෙල් පිරිපහදුව ඇතුළු බොහෝ ව්‍යාපෘති ඉරානයෙන් ලැබුණු දේ ලෙස ඔහු උදාහරණ දුන් අතර, එම මිත්‍රත්වය ඓතිහාසික හා භාවිතාමය ලෙස ඔප්පු වී ඇති බව අවධාරණය කළේය.

“දැන් මේ ආණ්ඩුව මේ කලාපයේ ආරක්ෂාවත් අවධානමට ලක් කරමින් ඉන්නවා. කලාපයේ ආරක්ෂාව දැන් මේ වෙනකොට ඇවිල්ලා තියෙනවා “ගෝර්” කියලා ඇමෙරිකානු විශේෂ නියෝජිතියෙක් ලංකාවටයි මාළදිවයිනටයි දෙකටම නියෝජිතිය යනවා දවස් හතරක්. ප්‍රධාන වශයෙන් මේගොල්ලෝ බලන්නේ ලංකාවේ වරායවල් සහ ගුවන් තොටුපළවල් ඒවා වර්ධනය කළ යුතු ආකාරය. දැන් අපිට ඔය චොපර් වගයක් දෙනවානේ හෙලිකොප්ටර් වගයක්. දැන් අපිට හිතෙන්නේ හරි ෂෝක් අපිට හරි ආදරයට දෙනවා කියලා. මේ අපට ආදරයට නෙවෙයි”

දැන් මේ ආණ්ඩුව මේ කලාපයේ ආරක්ෂාවත් අවධානමට ලක් කරමින් ඉන්නවා. කලාපයේ ආරක්ෂාව දැන් මේ වෙනකොට ඇවිල්ලා තියෙනවා “ගෝර්” කියලා ඇමෙරිකානු විශේෂ නියෝජිතියෙක් ලංකාවටයි මාළදිවයිනටයි දෙකටම නියෝජිතිය යනවා දවස් හතරක්. ප්‍රධාන වශයෙන් මේගොල්ලෝ බලන්නේ ලංකාවේ වරායවල් සහ ගුවන් තොටුපළවල් ඒවා වර්ධනය කළ යුතු ආකාරය. දැන් අපිට ඔය චොපර් වගයක් දෙනවානේ හෙලිකොප්ටර් වගයක්. දැන් අපිට හිතෙන්නේ හරි ෂෝක් අපිට හරි ආදරයට දෙනවා කියලා. මේ අපට ආදරයට නෙවෙයි

මෙම යුද්ධය සදාචාරාත්මක පදනමක් නොමැති අසාධාරණ ආක්‍රමණයක් බවත්, එය ඇමෙරිකානු තනි බල අධිකාරීත්වය (unipolar hegemony) අහිමි වීමේ වේදනාවෙන් හා බියෙන් ඇති වූ බවත් ඔහු ප්‍රකාශ කළේය. ඇමෙරිකානු ජනතාවගෙන් පවා මෙයට සහයෝගය අඩු බවත්, ඊශ්‍රායල්-සියොන්වාදී ලොබියේ බලපෑම ගැනත් (Epstein සිද්ධිය ඇතුළු චෝදනා උපුටා දක්වමින්) දැඩිව විවේචනය කළේය. ඔහු මෙය "සදාචාරාත්මක දවටනයක් නැති" යුද්ධයක් ලෙස හඳුන්වා, එය ලෝකයේ බහුකේන්ද්‍රීය බලයක් ගොඩනැගීමේ සටනක් බවත් පෙන්වා දුන්නේය.

ශ්‍රී ලංකාවේ වත්මන් ආණ්ඩුව හා ඔවුන්ගේ විදේශ ප්‍රතිපත්තිය දැඩිව විවේචනය කළ ඔහු, BRICS හා SCO සමුළුවලට සහභාගී නොවීම, ඉරාන නැව් භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම හා චීන සාගර ගවේෂණ යාත්‍රා සඳහා සම්මත මෙහෙයුම් පටිපාටිය (SOP) ඉන්දියාවට භාරදීම ගැන විශේෂයෙන් සඳහන් කළේය. ඉරාන

නැව් සම්බන්ධයෙන් ඇමෙරිකානු බලපෑමට යටත් වීම, එය රටේ ස්වාධීනත්වයට හා ආරක්ෂාවට තර්ජනයක් බවත් ඔහු කියා සිටියේය. එසේම ඇමෙරිකාව සමග ACSA, SOFA වැනි ගිවිසුම් හරහා රට මිලිටරි තිප්පොළයක් බවට පත්කිරීමේ උත්සාහයන් ගැනත් ඔහු අවධානය යොමු කළේය.

ඉරානය මේ සටන කරන්නේ බහුකේන්ද්‍රීය ලෝකයක් ගොඩනැගීම සඳහා බවත්, එය ඩොලර් ආධිපත්‍යය බිඳ දැමීමේ සටනක් බවත් ඔහු ප්‍රකාශ කළේය. එබැවින් ඉරාන ජනතාවගේ සටන ශ්‍රී ලංකාවේ සටනක් බවත්, ඔවුන්ගේ ජයග්‍රහණය ලෝක සාමයට, සංවර්ධනයට හා මනුෂ්‍යත්වයට හිතකර බවත් අවධාරණය කළේය. ඔහු සමාජ මාධ්‍යවල තමන්ගේ ඉරාන සහයෝගය පිළිබඳ පළකිරීම්වලට ලැබුණු විවේචන ගැනත් සඳහන් කරමින්, එවැනි අනුකම්පාව නොමැති මනස බෞද්ධ සංස්කෘතියට ගැලපෙන්නේ නැති බවත් පෙන්වා දුන්නේය.

අවසානයේදී ඔහු ඉරාන ජනතාවට විජයග්‍රහණය ප්‍රාර්ථනා කරමින්, බහුධ්‍රැවීය ලෝකයක් උදාවන දිනය නුදුරේ දැකගැනීමට හැකිවේවා යැයි ප්‍රාර්ථනා කළේය. මෙම දේශනය ශ්‍රී ලංකාවේ යුද්ධයට එරෙහිව නැගෙන හඬවල් අතරින් ඉතාමත් බලවත් හා සමාජීය බලපෑමක් ඇති කළ අවස්ථාවක් ලෙස සැලකේ. යුද්ධයේ බලපෑම් හමුවේ රටේ බලශක්ති අර්බුදය, ඉන්ධන හිඟය හා ආර්ථික බලපෑම් තීව්‍ර වන මේ අවස්ථාවේ මෙවැනි දේශනවලට විශේෂ අවධානය යොමු වී තිබේ.

## ***මෙම සම්මන්ත්‍රණයේදී විමල් වීරවංශ පවක්වන ලද***

## ***සම්පූර්ණ දේශනය මෙසේය***

වැඩමවා වදාළ ගෞරවනීය වන්දනීය පූජනීය මහා සංඝරත්නයෙන් අවසරයි. මේ අවස්ථාවට ජාතික නිදහස් පෙරමුණේ ආරාධනාව පරිදි සහභාගී වී සිටින, පැමිණි සිටින ඉරාන තානාපති කාර්යාලයේ නියෝජ්‍ය තානාපතිතුමනි. ඒ වගේම චීන තානාපති කාර්යාලයේ දේශපාලනාංශයේ ප්‍රධානී තුමන් ඇතුළු සියලුම නිලධාරී මහත්ම මහත්මියනි. ඒ වගේම අපේ සහෝදර දේශපාලන පක්ෂ සහෝදර දේශපාලන පක්ෂවල නියෝජිතයන් හැටියට මේ අවස්ථාවට සහභාගී වී සිටින, මා නම් වශයෙන් සඳහන් කරන්න යන්නේ නෑ කාලය ගත වන නිසා. ඒ සියලුම දෙනාගෙන් අවසරයි.

අද ලෝකයේ සිදුවෙන බලවත් සිදුවීම්වලට සංවේදීව හිතන, එයලාගේ ජීවිතය මුහුණ දෙන ප්‍රශ්නයක් හැටියට දැනෙන හදවත් ඇති සියලුම මවුරුණී පියවුරුණී, සහෝදර සහෝදරියනි ඔබ සියලු දෙනාගෙන් අවසරයි.

මෝහන් සමරණායක මැතිතුමන් ඉතාම විශිෂ්ට ආකාරයට මෙම ඉරාන ආක්‍රමණය, ඇමෙරිකා එක්සත් ජනපදය සහ ඊශ්‍රායලය එක්ව සිදු කරන ඉරාන ආක්‍රමණයේ සැඟවුණු කතාව එතුමන්ගේ අදහස් දැක්වීමෙන් මනාව අනාවරණය කරන ලද නිසා මම ඒ පිළිබඳව නැවත නැවතත් කරුණු ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙන්නේ නෑ.

ඒ වෙනුවට මේ අරබුදය සමග බැඳුණු, මේ මගින් නිර්මාණය කොට තිබෙන ගෝලීය අරබුදය සමග බැඳුණු තත්ත්වයන් කොයි විදිහට කොයි අතකට වර්ධනය වෙයිද කියන ප්‍රශ්නය ගැන ඔබේ අවධානය වැඩිපුරටත් යොමු කරන්න මම උත්සාහ ගන්නවා. මීට පෙර සඳහන් වුණා වගේම "ඉරානය ශ්‍රී ලංකාවේ ඉතාම ගැඹුරු මිත්‍ර රාජ්‍යයක්". ජෙනරල් කොබ්බැකඩුව යුද්ධය මෙහෙයවන වෙලාවේ උතුරේ අපේ හමුදාවන්ට නොතිබුණු උණ්ඩ සතියට එක විශාල ගුවන් යානයක් බැගින් නොකඩවා අපට උපකාරණය කරපු, ලබා දීපු අපේම මිත්‍ර රටක්.

අනෙක් රටවල් ඒ අවශ්‍යතාවය සම්පූර්ණ කරන්න බැහැ කියපු වෙලාවේ, චීනය වගේම ඉරානයත් ඒ හැම දුෂ්කර අවස්ථාවකදීම අපේ හමුදාවන් දුර්මුඛ වෙන වෙලාවල්වලදීම ශ්‍රී ලංකාවේ ඒකීයත්වය රකින්න භෞමික අඛණ්ඩතාවය රකින්න සාමේ දිනා දෙන්න ඒ අවශ්‍ය කරන සහයෝගය ලබා දුන්නා. ඒ විතරක් නෙවෙයි. ජාත්‍යන්තර තලයේදීත් ශ්‍රී ලංකාවට රැහැණිව ගෙනෙන සෑම යෝජනාවකදීමත් රුෂියාව චීනය වගේම ඉරානයත් හැම වෙලාවෙම අපේ පැත්තේ හිටගත්තා. මිත්‍ර රටවල් කියන්නේ එහෙම ඉතා දිගු අතීතයක් දක්වා තිබෙන මිත්‍රත්වයක්. සමහරු හිලෝ හොයපු උමා ඔය ව්‍යාපෘතිය ඉරානයෙන් අපට ලැබුණු දෙයක්. බියගම තෙල්පිරිපහදුව ඉරානයෙන් අපට ලැබුණු දෙයක්.

මේ රටේ කොතනක හරි තියෙනවා නම් චීනයෙන් එක්සත් ජනපදයෙන් ඉරානයෙන් ලැබුණු දේවල් තමයි අපට දකින්න තියෙන්නේ. ඊට අමතරව රූපවාහිනි සංස්ථාව තියෙනවා ජපානෙන් හම්බවුණු. ඒක දෙනකොට ජපාන කොන්දේසියක් දැම්මා මේ සුදුව ප්‍රවර්ධනය කරන්න බෑ කියලා. ඔන්න ඔට්ටු වැලිල්ල ප්‍රවර්ධනය කරන්න බෑ කියලා. දැන් ඒ රූපවාහිනී නාලිකාවලින්ම මැච් එක පෙන්නනවා ඔට්ටු ඔට්ටු අල්ලන්න ඩිජිටල් ආකෘති උගන්න උගන්න. කෙසේ වෙතත් භාවිතාව ඇතුළේ ඓතිහාසික භාවිතාව ඇතුළේ ඔප්පු කොට පෙන්වූ තිබෙන මිතුරන්. ඒ මිතුරන්ට වෙන හිරිහැරය එහෙම නැත්නම් ඒ මිතුරන් මුහුණ දෙන දුක්ගැහැට ඒවා රාජ්‍යයක රට වැසියන් හැටියට අපට දැනෙන්න ඕන. ඒවා අපේ දුක් ගැහැට. ඒවා අප ඉදිරිපිට පැන නැගෙන අපේම ගැටලු.

ඒ නිසා ඒවාට අපට හැකි ආකාරයකින් එයින් අපේ මිත්‍ර රටවල් ඒ මුහුණ දී තිබෙන අභියෝගයෙන් ජය ගැනීම සඳහා වචනයකින් හෝ උදව් විය හැකි නම් ඒක තමයි අපේ අවම මනුෂ්‍ය යුතුකම. මම මේ ටෙඩි බෙයාර් කතන්දරයෙත් එක්ක සමාජ මාධ්‍යවල ප්‍රදර්ශනයක් ගැන මේක දාලා තියෙද්දී ඔය මෝහාන් සහෝදරයා කියපු අර "ඩොබිලට වඩා හොඳයි සේදුම්" කියන එක, එතකොට ඒක එක්කෙනෙක් ඇවිල්ලා

දාලා කමෙන්ට් එකක්... උඹට පිස්සු ද.... මේ රටේ දෙයක් බලාගනින්. උඹ ඔය විකාර කරන්නේ නැතුව කියලා.

මම ඒ ප්‍රොෆයිල් එකට ගිහිල්ලා බැලුවා. ෆේක් එකක්. හැබැයි ඔක්කොම තියෙන්නේ මාලිමා ප්‍රවර්ධනය, ජනාධිපතිවරයාගේ ප්‍රතිරූප ප්‍රවර්ධනය ඒ වගේ දේවල් තමයි තියෙන්නේ මඩ ගහනවට අමතරව. එතකොට දැන් ඒ ඒවීපී අයට දැන් මේවා මේ අනවශ්‍ය ප්‍රශ්න. අපි දන්න ජේවීපීඑකට මේවා අත්‍යවශ්‍ය මැදිහත් විය යුතු අවස්ථා. දැන් ඒගොල්ලෝ එයාට අනුව මේ රටේ දෙයක් බලාගෙන හිටියහම හරි.... මොකක්ද ඔය පිස්සු කරන්නේ කියලා අහනවා. එතනින් පේනවා ඒ මනස අපිට උගන්නලා තියෙන්නේ දේශපාලනයට එන්න කලින්, පුංචි කාලේ දහම් පාසල් ගිහිල්ලා. අපේ අම්මල තාත්තලා අපේ හාමුදුරුවෝ අපිට උගැන්නුවේ සියලු සත්වයෝ නිදුක් වෙත්වා, නීරෝගී වෙත්වා, සුවපත් වෙත්වා කියලා.

එතනින් අපි ජාත්‍යන්තරය විශ්වීත්වය අපි ඉගන ගත්තේ මුලින්ම එතනින්. කාල් මාක්ස පොත් බලන්න ඊට කලින් ඉගෙන්නුනුවේ.

එහෙම ඉගෙනගත්තු පොළොවක මිනිසෙකුට ඉරානයට එරෙහිව අසාධාරණ අයුක්ති සහගත ආක්‍රමණයක් සිද්ධ වෙනකොට, පළවෙනි දිනයේම ඉරානයේ දියනියන් 162ක් අමු අමුවෙන් මරා දානකොට, එහි අධ්‍යාත්මික නායකයා ඇතුළු නායකයන් මරා දානකොට, අවුරුදු දසක තුනකට වඩා වැඩි කාලයක් තිස්සේ දැවැන්ත සම්බාධක මැද අසීරු දුෂ්කර කොන්දේසි මැද, ඉරාන ජනතාවගේ අප්‍රතිහත ධෛර්යයෙන් ගොඩනැගුණු මහා රාජ්‍යය වනසන බව දැනෙනකොට, ඒක තමන්ගේ ප්‍රශ්නයක් කියලා දැනෙන්නේ නැත්නම් සියලු සත්වයෝ නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත් වේවා කියන සංස්කෘතියෙන් හැදිච්ච මිනිසුන්ට.... එහෙම මිනිසෙක් නෙවෙයි අර කමෙන්ට් එක දාන්න. ඒ තමයි අනාගමික නරුම මිනිසා.

දැන් ඒ නිසා අපට මේ ප්‍රශ්නය අපේ ප්‍රශ්නය. මේ එන්නේ ලෝකයේ තනි බල කේන්ද්‍රය අහිමි වීමේ වේදනාව පිට කිරීමේ අවස්ථාව. තමන් සතුව නතු කරගෙන ආපු ලෝකයේ එකම සහ අවසන් තීරකයා ය කියන තත්ත්වය නැති වේවි කියන බිය පිට කරන ආකාරය. ඒක පිට වෙන්නේ ඊයේ වෙනිසූලාවට අද ඉරානයට හෙට මේක තව කොහෙටද කියලා ඔවුන් තමයි තීරණය කරන්නේ.

ඉතින් ඒ නිසා ප්‍රශ්නය මිසයිලය අපේ පොළොවට වැටෙනකන් අපි ඒකට සංවේදී වෙන්න බලා සිටිය යුතු නෑ. ඒ මිසයිලය වැටෙන්නේ කුමන හෝ පොළොවටද ඒ පොළොව අපේ පොළොව. ඒ රට අපේ. ඒ වැසියන් අපේ වැසියන්. අපි හිතන්නේ එහෙම. දැන් අපිට පේනවා මේ යුද්ධයට, මෝහන් සමරණායක මැතිතුමා කිව්වා වගේ සදාචාරාත්මක දවටනයක් නැහැ. මීට කලින් ඇමෙරිකාව කරපු බොහෝ යුද්ධවලටත් සදාචාරාත්මක දවටනයක් නැහැ. හැබැයි නැතත් කිසියම් ආකාරයක සදාචාරාත්මක දවටනයක් නිපදවුණු ලැබුවා. එහෙම වැරදි වුණත් එහෙම යම්කිසි සාර්ථක සදාචාරාත්මක වටිනාකමක් නිර්වචනයක් මේ යුද්ධයට නම් කෙහෙත්ම නෑ.

එතකොට ඒ නිසා තමයි අද ඇමෙරිකා එක්සත් ජනපද ජනසමාජයේ මේ යුද්ධය අනුමත කරන අය ඉතා සුළු ප්‍රතිසතයක් බවට පත් වෙලා ඉන්නේ. ඒ නිසා තමයි අර ප්‍රති ත්‍රස්ත ඒකකයේ ප්‍රධානියා තමාගේ හරද සාක්ෂියට අනුව මේකට ඉන්න බැහැ කියලා ඉල්ලා අස්වෙන්නේ. මේක සදාචාරාත්මකව නිවැරදියි කියලා හේත්තු ගන්නවන්න පුළුවන් තරකනයක්, ආඛ්‍යානයක් ට්‍රම්ප්ටවත් කාටවත් බෑ. ඒ ප්‍රතිත්‍රස්ත ඒකකේ ප්‍රධානියා කියපු විදිහට මේක ‘‘සියොන්වාදීන්’’ ඊශ්‍රායලේ සහ ඇමෙරිකාව තුළ ඉන්න ඔවුන්ගේ ලොබි එක ඉතා බලවත්ව කරන මැදිහත් වීමක ප්‍රතිඵලයක්. සියොන්වාදීන් හොයන්නේ පොරොන්දු දේශය.

එක්සත් ජනපදය ඇතුළේ බලවත් කණ්ඩායමක් බවට පත්ව සිටින්නේ ඔවුන්. මෑතකදී අනාවරණය වුණා ‘‘එබ්ස්ටීන්’’ කියන පුද්ගලයා හා බැඳුනු කතාව. දූපතක ඇමෙරිකානු ප්‍රභූ තන්ත්‍රයම අරගත්තු කාම සුවය. ජීවිතය. බිල් ගේට්ස්ලා බිල් ක්ලින්ටන්ලා ඒ අයගේ බිරිදේවරු ඩොනල්ඩ් ට්‍රම්ප්ලා කුඩා දියනියන් තමන්ගේ ලිංසික කෙළිබඩු බවට පත් කරගෙන. අවුරුදු 12 දියනියන් ලොව විවිධ තැන්වලින් පැහැරගෙන ආපු... එපමනක් නෙවෙයි. ඇතැම් අවස්ථාවල ඒ දියනියන් මරා රුධිරය බීපු, තමන් තිරිහන් වෙන්න... තමන් අදහන දෙවියෝ ගාවට යන්න ඒක අවස්ථාවක් ලැබෙයි කියලා හිතලා. එපමණකුත් නෙමෙයි එයාව අලු කරලා ඒ අලු වලින් අත්පලදනා හදාගෙන ජීවත් වුණු නරුම දූපතක් ගැන කතාවක් තමයි ඒස්රීල් කියලා කියන්නේ.

මෙහෙම මනසක් තියෙන බල සාධකයකට ඒ විදිය අපරාධ තමන්ගේ කිසියම් ඇදහිල්ලක් එක්ක සම්බන්ධ කරලා සාධාරණීකරණය කරගන්න පුළුවන් නම්, යමෙකුට මේ මුළු ලෝකෙම එහෙම එක්කෙනෙකුට පේන්නේ බිලිගත යුතු, බිලිදිය යුතු නරබිලි හැටියට. ලේ උරා බිය යුතු දරුවන් හැටියට. ඒ නිසා දරුවන් ගැනවත් වෙනත් කාන්තාවන් ගැනවත් ඔය කියන ස්ත්‍රී අයිතිවාසිකම් ගැනවත් මොකක් වත් එතනට අදළ නැහැ. තියනවා කියනවා නම් ඒ පට්ටපල් බොරුවක්.එතනින් පෙන්වූ ඔවුන්ගේ සභ්‍යත්වය ස්වභාවය, සභ්‍යත්වය කියන්න බෑ අ අසිෂ්ඨත්වයේ ස්වභාවය. ඒ අසිෂ්ඨ මනස රටවල් ගැන තීරණ ගන්නවා.

මෝහන් සහෝදරයා කිව්වා වගේම මේකේ ඇත්ත පදනම තියෙන්නේ මේ චීනය වට කොට පහරදීම. අපට පේනවා මේකේ බැලු බැල්මට අද එළිපිට පේන්න නැති වුණත් ඉරානය තනියෙන් නෙමෙයි මේ සතුරට මුහුණ දෙන්නේ. ඉරානය වටා මිත්‍ර සහයෝගිතාවයක් තියෙනවා. ඒ මිත්‍ර සහයෝගිතාවයත් සහිතව තමයි ඉරානය අද මේ ලෝකයේ බලගතු අධිරාජවාදී ආක්‍රමණිකයාට මුහුණ දෙන්නේ. අපි මුලින්ම ප්‍රණාමය පුද කරනවා මේසා මෙපමණ තීරණාත්මක ආක්‍රමණයකදී යටත් වීමේ මාර්ගය තෝරා නොගෙන සටන් කිරීමේ මාර්ගයේ නොබියව ඉදිරියට යන ඉරාන දේශප්‍රේමී ජනතාවට. ඒ අධිෂ්ඨානය අපිව රකින අධිෂ්ඨානයක්. ඒ සටන්කාමිත්වය අපිව රකින සටන්කාමිත්වයක්. ඒ අප වෙනුවෙන් වන සටන්කාමිත්වයක්. ඇයි? මේ සටනයේදී ඔවුන් ලබන ජය. ඔවුන් පටන් ගත්තොත් ආක්‍රමණයක් නෙවෙයි. ඔවුන් පටන් ගත්තු යුද්ධයක් නෙවෙයි. ඔවුන් මත බලත්කාරයෙන් පටවන ලද යුද්ධයක්. ඒ යුද්ධය පටන්

ගත්තේ ඔවුන් වුණාට, ඇමෙරිකාව සහ ඊශ්‍රායලය වුණාට, ඉරාන නායකයන් කියන්නේ අවසන් කරන්නේ අපි.

ඒ අවසන් කරන දිනය වෙනකොට ලෝකයේ බහුකේන්ද්‍රීය බලයක් ගොඩනැගුණොත්, පෙට්‍රෝල් ඩොලර් එක වෙනුවට පෙට්‍රෝල් යුවාන් ලෝකයේ බලවත් මුදල් ඒකකය බවට පත් වුනොත් එතැන් සිට අප හුස්ම ගන්නේ අලුත් ලෝකයක් ඇතුළේ. ඒ අලුත් ලෝකය අපේ වගේ රටවලට ආරක්ෂාව, දියුණුව, සංවර්ධනය උත්පාදනය කර දෙන අලුත් ලෝකයක්. ඒ නිසා ඉරානය මේ සටන් කරන්නේ අන්න ඒ අලුත් ලෝකයට, අපි කාටත් හිතකර අලුත් ලෝකයට මේ ලෝකය පරිවර්තනය කිරීමේ අධිෂ්ඨානය සහිතව. ඒ නිසයි අපි කියන්නේ මේක අපෙත් සටන.

සමහර මෙහේ ඉන්නවා දැන් ඔය "ඊශ්‍රායල් සල්ලි අරගෙන" මහා සිංහල ජාතිවාදීන් වගේ පෙනී ඉන්න කට්ටියක්. ඒගොල්ලෝ හිටපු ගමන් යනවා ඊශ්‍රායල් කොඩි අරගෙන පාරේ. ඊශ්‍රායලය තමයි යාපනය අල්ලපු වෙලාවේ, එල් ටී ටී ඊය යාපනය අල්ලා ගැනීමේ අවධානම ඇතිවුණු වෙලාවේ, රත්වත්තේ මහත්තයා නියෝජ්‍ය ආරක්ෂක ඇමති හැටියට ඉන්න වෙලාවේ, මල්ටිබැරල් රොකට් ලොංචර් ලැබුණේ ඒ අවධානමෙන් මිදෙන්න. ඒක ඊශ්‍රායලෙන් තමයි අපිට ගන්න සිද්ධ වුණේ. ආවා.... ආවේ කැඩිච්ච මල්ටිබැරල් රොකට් ලොංචර්, වයර් කපපු මල්ටිබැරල් රොකට් ලොංචර්.

ඊට පස්සේ මෙහේ ඒවා ආයි යවලා ඒවා ආයි හදාගෙන ආයි එනකොට යාපනය ගිහිල්ලා ඉවරයි, අහිමි වෙලා ඉවරයි. හොඳ වෙලාවට මොරටුව විශ්ව විද්‍යාලයේ පසුකාලෙක අමිත්ත මුණින්දදාස. එතුමා ඊශ්‍රායලේදිම සැක කටයුතු විදිහට මැරුණා. එතුමාගේ ඥානය තිබුණු හින්දා ඒවා ඉතා කෙටි කාලයක් තුළ නවීකරණය කරගෙන සතුරාට එරෙහිව යොදගන්න පුළුවන්කම ලැබුණා.

ඉරානයවත් චීනයවත් එහෙම මේ වයර් කපපු ඒවා අපිට දුන්නු රටවල් නෙවෙයි. සල්ලිත් අරන් බඩුත් දෙනවයි කියලා පෙන්නගෙන වයරුත් කපලා එවපු අය නෙමෙයි. අද මේ රටේ අද මොසාඩ් එක බලවත්ව ක්‍රියාත්මක වෙනවා. මේ ආණ්ඩුව ආවට පස්සේ පළවෙනි වතාවට පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයක් පිහිටුවන්න පටන් ගත්තා. ඊශ්‍රායල් ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය කියලා. හොඳ වෙලාවට මේකට ඒගොල්ලෝ කපටිකමට සභාපති කරන්න යෝජනා කරලා තිබුණේ සමගි ජනබලවේගේ පාර්ලිමේන්තු මන්ත්‍රී සුජීව සේනසිංහ. හොඳ වෙලාවට ඊට කලින් දවස තමයි මේ ටිරාන් අලස් මැතිතුමා දන්නවා. උදේ අපි ඔක්කොම නුවර ගියා ඔය සුජීව සේනසිංහ මහත්තයාත් ගියා. මහනායක හාමුදුරුවෝ බැහැ දකින්න. බස් එකේ එකට ගියේ. යනකොට මේක දැනගත්තා. දැනගත්තම අපි තේරුම් කරවා මනුස්සයෝ ඔයා ඔය සභාපතිකම ගන්න එපා ඕක මරාලයක්.

දැන් ජේවීපී එක ගමේ මරණාධාර සමිතියේ සභාපතිකම වත් වෙන මිනිහෙකුට දෙන්නේ නැහැ. අපි දන්නවනේ මේ මහළු සමිතිය මේ සුභසාධන සමිතිය සමුපකාර සමිතිය මේ හැම එකම අල්ලන ජේවීපී එක මේ මිත්‍රත්ව සංගමයේ සභාපතිකම විතරක් සුජීවට දෙනවා. සුජීවට මේක අපි කිව්වම තේරුණා. ඊට

පස්සේ කතා කරලා කිව්වා මට එන්න වෙන්නේ නැහැ. පාර්ලිමේන්තුවට දැනුම් දුන්නා එන්න වෙන්නේ නැහැ කියලා. දැන් අපි මේ බස් එකේ යන හින්දා අපි මේ ඔක්කොම දැනගත්තා දැන් සජීවීව අත්විඳිනවා. ඊට පස්සේ දැන් මේ ඉන්න කථානායකතුමාගේ ලේකම් කතා කරනවා "අනේ සර් කරන්න එපා, සර් සර් හින්දාමයි දැන් මේක ආවේ". "ඊශ්‍රායල් තානාපතිතුමා ඉන්දියාවේ ඉඳලා කොළඹට ඇවිල්ලා සර් දැන් හෙට එතුමා මේකට එන්න බලාගෙන ඉන්නේ සර්". ඉතින් එතකොට සුජීව මන්ත්‍රී කිව්වා "නෑ ඉතින් වෙන ආණ්ඩුවේ මන්ත්‍රී කෙනෙක් දාගෙන සභාපති කරන්න ප්‍රශ්නයක් නැහැ. මට එන්න බෑ එච්චරයි". "නෑ එහෙම බෑනේ සර් මේක විපක්ෂයෙන්ම කෙනෙක් ඕනනේ සර්". සුජීව කොහොමත් බෑ කිව්වා. ඊට පස්සේ කල් දැම්මා.

අන්න බලන්න "අධිරාජ්‍ය විරෝධී" ආණ්ඩුව. ඒගොල්ලෝ අධිරාජ්‍ය ගැතියි කියන රනිල් වික්‍රමසිංහ ජනාධිපති වෙලා හිටපු වෙලාවේවත් පාර්ලිමේන්තුවේ ඊශ්‍රායල් ශ්‍රී ලංකා මිත්‍රත්ව සංවිධාන පිහිටුවන්න හැදුවේ නැහැ. ඊට පස්සේ තමයි අරය ඉතින් හිස් අතින් ගියා. ක්‍රමානුකූලව තනාපති කාර්යාලකුත් මේ පස්සට බින්න බස්සවන්න තමයි හදන්නේ කුරුමානම අල්ලන්නේ.

එතකොට දැන් බලන්න ඒ නිසා මේ සටන ගැන අපේ තියෙන්න ඕන තක්සේරුව තමයි මේ අපේ සටනක් ඉරානය අද අපි වෙනුවෙන් කරන්නේ. ඒක ඉරානය රැක ගැනීම පිළිබඳ සටනක් පමණක් නෙවෙයි. ලෝකයේ අයුක්ති සහගත අසාධාරණ දුෂ්ට බල කේන්ද්‍රය ඉවර කොට බහුකේන්ද්‍රීය ලෝකයක් නිර්මාණය කිරීම සඳහා වූ සටනක්. ඒ බහුකේන්ද්‍රීය ලෝකය තමයි අපිව රකින ලෝකය, මනුෂ්‍යත්වයට වටිනාකම දෙන ලෝකය, අශිෂ්ඨත්වය මකා දමන ලෝකය, ශිෂ්ඨත්වය වගා කරන ලෝකය. ඒ බහුකේන්ද්‍රීය ලෝකයයි අපිට ඕනේ. ඒක කේන්ද්‍රීය ලෝකය, යුද්ධ නිර්මාණය කරන ලෝකය, අශිෂ්ඨත්වය වගා කරන ලෝකය, ලේච්ඡත්වය වගා කරන ලෝකය, මනුෂ්‍ය වටිනාකම්, සංස්කෘතික අනන්‍යතා, සංස්කෘතික වටිනාකම් ආගමික වටිනාකම් සියල්ල කෙලෙසන ලෝකය. ඒ නිසා ඒක ද්‍රවීය ලෝකය බහුද්‍රවීය ලෝකයක් විය යුතුයි.

බහුද්‍රවීය ලෝකයක් බවට පත් කරන සටනක තමයි ඉරානය අද මේ නිරත වෙලා ඉන්නේ. ඒ නිසා ඒ අපේ සටන. දැන් මේ තත්ත්වය ගැන අපේ ශ්‍රී ලංකාවේ පාලනය මොකක්ද මේ දිහා බලන විදිය? අපි කවුරුත් දන්නවා මුලින්ම ආවා ආරාධනාව බ්‍රික්ස් (BRICS) සමුළුවට එන්න කියලා. රුෂියානු ජනාධිපති පුටින්ගෙන් තමයි අස්සන් කරලා එවුවේ. ඒට ගියේ නෑ, ඒක ප්‍රතික්ෂේප කළා. ඒ කියන්නේ ඇමෙරිකා එක්සත් ජනපදය තරහ වෙයි කියන බයට. ඊළඟට ශැංහයි සහයෝගිතා (SCO) සමුළුවට එන්න කියලා චීනයේ ආරාධනාව තිබුණා. යන්න හිටියේ නැති ඉන්දියානු අග්‍රමාත්‍ය මෝඩි පවා ඒ සමුළුවට ගියා. ඒ සමුළුවට ගියා නම් අපේ මිත්‍ර රටවල්වල රාජ්‍ය නායකයෝ රාශියක් එතනට ඇවිල්ලා හිටියා. එහෙනම් මේ අද මුහුණ දෙන තත්ත්වයන්ට උදව් ගන්න පුළුවන් සම්බන්ධතා ගොඩක් නිර්මාණය කරගන්න තිබුණා. ඒකත් ගියේ නෑ, යූ එස් අප්පච්චි තරහ වෙයි කියලා, "ට්‍රම්පච්චි" තරහ වෙයි කියලා ඒකත් මග හැරියා.

ඊට පස්සේ අර ගන්ධබ්බ කාලයක් තිබුණා ජපානයෙන් මේ අන්තර්කාලීන අගමැති කෙනෙක් ඉන්න කාලයක්. ඒ කාලේ තර්කයක් ජපානයට තිබුණා ලෝකයේ ගෝලීය දකුණ අතහරපු පාලනයක් මේ

වෙලාවේ මේ ඇති වෙලා තියෙන්නේ කියලා. එතන තමයි අපේ මිත්‍ර සැබෑ මිත්‍ර රටවල් තියෙන්නේ. ඒ රටවල් කෙරෙහි මිත්‍ර සංවේදීභාවයක් නැති පාලනයක් අද මේ තියෙන්නේ. දැන් බලන්න මොකක්ද අර ඉරාන නැව්වලට වුණේ? මම කරපු ගවේෂණය ඇතුළේ මම ලබාගත්තු තොරතුරු අනුව ඉරාන නැව් ඉන්දියාවට යවන්න නෙවෙයි හිටියේ එලියට.

ඇමෙරිකා එක්සත් ජනපදය ඒ වෙනකොට ලබා දීලා තිබුණා ඉන්දියාවට මාසයක සහන කාලයක් රුෂියාවෙන් තෙල් මිලදී ගන්න. ඒ ගමන ඇමෙරිකා එක්සත් ජනපදය කිව්වා "ඔබලා මේ නැව් ටික යවන්න ඕන ඕගොල්ලෝ යැව්වේ නැතත් අර සහන කාලේ අපි ඕගොල්ලන්ට දෙන්නේ නැහැ" කියලා. ඉන්දියානු නායකයන් කල්පනා කළා මේක යවන්න නැතුව තියාගෙන අර දැන් බලශක්ති අර්බුදයකුත් ලකුණු පේන නිසා මේ චාන්ස් එක අහිමි කරගන්න එක මෝඩකමක් කියලා. ඉන්දියානු බලධාරීන් ලංකාවේ බලධාරීන්ගෙන් ඇහුවා "අපිට උඹලාට මේ උදව්ව කරන්න පුළුවන්ද? අපි වෙනුවෙන් මේ අපේ උත්සවයට ආපු මේ නැව් ටික ඔබලා භාර ගනිල්ලා අපි ඒකත් පස්සේ වෙලාවක භාර ගන්නම්, ඒකට උඹලාට බලශක්ති අර්බුදයක් ඇති වෙන්න දෙන්නේ නැහැ අපි බලාගන්නවා" කියලා.

පළවෙනි වටේදී හා කිව්වා. මම දන්නේ නෑ ඉතින් හරියට තේරිලා හා කිව්වද නැද්ද කියලා හාං කිව්වා. ඉතින් හාන් කිව්වට පස්සේ දෙවි හාමුදුරුවනේ රටක වගකීමක් වශයෙන් ඒ හාන් කියන එක එහෙට ගියා. ගිය හින්දයි නැව් ටික ආවේ. ආවෙත් අපේ කලාපෙට බරව. ඒ හින්දා තමයි මෙහෙට බරව ආවේ. නැත්නම් වෙන කොහෙට හරි බර වෙලා යන්න තිබ්බනේ. ඇරෙහෙන් පිටත් වුණු ගමන් ඇමෙරිකාවෙන් තර්ජනය ආවා මෙහෙට. මෙහෙ ඉන්න මෙලෝ රහක් නැති කට්ටියට ආවා කෝල් එක "බාරගන්න එහෙම එපා නැව්" කියලා. ඊට පසුවෙන දවස උදේම ආරක්ෂක ලේකම් තුමිය කොළයක් යවනවා ලිඛිතව දැනුම්දීමක් ඉරාන තානාපතිතුමාට "සමා වෙන්න අපිට මේ නැව් බාර ගන්න බැහැ" කියලා. දැන් ඇහුවේ මග දැන් ඉන්දියාව හිතනවා අපි භාර ගන්නවයි කියලා, ඇමෙරිකාව කිව්ව හින්දා අපි දැන් කියනවා බාර ගන්න බැහ කියලා. නැව ඉන්නවා දෙලොවක් අතර, දෙගොඩක් අතර. පැය 11ක් යනවා ඔහේ නැංගුරම් ලාගෙන තියාගන්නවා. ඇවිල්ලා ගහලා යනවා. ඔන්න විශිෂ්ට රාජතාන්ත්‍රික භූමිකාව! මෙච්චර මිත්‍ර එක්කෝ බැරිනම් බැහැ කියලා ඉන්දියාවට කලින්ම කියන්න ඕන "අනේ සමා වෙන්න අපිට ඔය මේ වෙලාවේ කරදරවල වැටෙන්න බැහ" කියලා. එහෙම කියන්නේ නැතුව "ඔයාගේ බලශක්තිය අර්බුදයක් එන්න දෙන්නේ නැහැ අපි ඔබව බලාගන්නවා" කියපු ගමන් ඩෝන් ගාලා හාන් කිව්වා. මොන තරම් චපල පිළිවෙතක්ද? වාසිය පෙනිච්ච ගමන් කෙල්ලට හා කිව්වා.

සල්ලි එච්චර නැහැ කියලා පෙනිච්ච ගමන් කෙල්ලට බූට් එක තිබ්බා. මම කියන්නේ තඹුත්තේගම වත් නැහැ ඔහොම චපල පෙම්වත්තු. පෙම්වතෙක් වුනත්. මොනවා වුනත් ගමේ ඉන්නවා රියල් පෙම්වත්තු තුන්වේලම කාගෙන මේ බොක්කෙන් ලව් කරනවා. දැන් අර නැවට ගහලා ගියා. ඊට පස්සේ තමයි ඉන්දියාව පීඩනය දෙන්න ගත්තා. ඉන්දියාව පීඩනය දෙන්න ගත්තා, ඒක ඉන්දියාව සැලකුවේ තමන්ට කරපු ලොකුම අසාධාරණයක්, අගෞරවයක් හැටියට. ඇයි? ඉන්දියාවටයි ඒ අවමානය ආවේ. මේ අනතුරුදායක තමන්ගේ රටේ උත්සවයට ආපු ආරාධිතයාව අනතුරුදායක වෙලාවක අනාරක්ෂිතව ඇයි ඕගොල්ලෝ පිටමං කළේ? ඒක තමයි විපක්ෂය ඇතුළෙනුත් ඉන්දියානු නායකයන්ට ආපු චෝදනාව.

නමුත් ඇත්ත ප්‍රශ්නය තියෙන්නේ මෙතන. ඊට පස්සේ තමයි බොහොම අමාරුවෙන් ආයේ ඇමෙරිකානු කට්ටියත් එක්කත් කතා කරලා ඒගොල්ලොන්ටත් මේ බැගෑපත් වෙලා එක නැවක කට්ටියක් කොළඹටයි අනිත් නැව ත්‍රිකුණාමලයටයි යවන්නේ. ඉතුරු ටික ගත්තා ඉන්දියාවට. දැන් බලන්න මේ ඉන්දියානු සාගර කලාපයට යුද්ධය ගෙනාවා මේ මේ ගොන් අමන තීරණ මගින්. භාර ගන්නවයි කිව්වා නම් භාර ගන්න ඕනේ. ඒ අවස්ථාවේදී ඇමෙරිකාව බලෙන් කියනවා වරායට ගෙනල්ලා නැංගුරම් දැම්මොත් වරායේ තියෙද්දි නැවට ගහනවා කියලා උඩින්.

එහෙම කියලා තමයි තීරණය අවලංගු කරවන්නේ. මේ වැනෙන දෙබිඩි ප්‍රතිපත්තිය තමයි ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය අගාධයට ඇදගෙන ගිහිල්ලා තියෙන්නේ. ඒ විතරක් නෙවෙයි. මම ඒකයි කිව්වේ බ්‍රික්ස් සමුළුව වර්ජනය කළා, ශැංහයි සහයෝගිතා සමුළුව වර්ජනය කළා. ඉරාන නැව් සම්බන්ධ ප්‍රතිපත්තියේ දෙබිඩි භාවය මනවින් ප්‍රදර්ශනය වුණා. අමාරුවේ වැටුණු වෙලාවට හැමවෙලේම උදව් කරපු රටක නාවික යාත්‍රා භාරගන්නම් කියලා පොරොන්දු දීලා පොරොන්දුව කැඩුවා. ඒකෙන් මේ සාගර කලාපයේ අනාරක්ෂිත ස්වභාවය නිර්මාණය කළා.

ඒ විතරක් නෙවෙයි, ඒ විතරක් නෙවෙයි, මේ වෙනකොට ඔබ දන්නවා චීන ගවේෂණ යාත්‍රා තියෙනවා සාගර ගවේෂණ යාත්‍රා. ඒ චීන සාගර ගවේෂණ යාත්‍රා ඔබ දන්නවා පහුගිය ආණ්ඩු කාලේ සාමාන්‍යයෙන් අවුරුද්දකට එකක් එකක් එහෙම පුළුල්ව මේ කලාපෙට එනවා. සාමාන්‍ය මේ සාගර ගවේෂණ යාත්‍රා ගැන ඉන්දියාව සතුටක් නෑ මේ කලාපෙට එනවට. දැන් මේ ආණ්ඩු ආවට පස්සේ තාම මේ වෙනකන් ලංකාවට සාගර ගවේෂණ යාත්‍රාවක් ආවේ නැහ. හැබැයි මේ පහුගිය 19 වෙන්ද මට මතක හැටියට ගිය මාසේ 19ද කොහේද චීන සාගර ගවේෂණ යාත්‍රාවක් ආවා මාල දිවයිනට ඇවිල්ලා එහෙන් ඒ සපෝට් එක අරගෙන ගියා, කොළඹ වරායට ආවේ නැහැ. දැන් කොළඹ වරායට තමයි එන්න අහන්නේ.

එතකොට ලංකාවේ ආණ්ඩුවේ කට්ටිය මොකද කියන්නේ? ඒගොල්ලෝ කියනවා විලි ලැජ්ජාවක් නැතුව ඒගොල්ලෝ කියනවා වරායට මෙබඳු යාත්‍රා ගෙන්වීම පිළිබඳ සම්මත මෙහෙයුම් පටිපාටිය (SOP) ඉන්දියාව මගින් සකස් කරමින් සිටිනවා කියලා. SOP එක ඉන්දියාව ඒක සකස් කළාට පස්සේ අපි ඒ ගැන ඕගොල්ලන්ට කියන්නම් කරන්න පුළුවන් දේ මොකක්ද කියලා. පෙනෙනවද? මේ රටේ වරායකට එන නැව් ගැන සම්මත මෙහෙයුම් පටිපාටිය හදන්න ඉන්දියාවට භාර දෙනවද? මීට කලින් හිටපු මම කියන්නේ මීට කලින් හිටපු මේ මේ දුර්වලම පාලකයෝවත් ඉන්දියාවටද ඒක හදන්න දුන්නේ? ඒක හදන්න ඕනේ අපි. ඉන්දියාවට අනාරක්ෂිතභාවයක් ඇති නොවෙන ආකාරයට හදන්න ඕනේ, හරි ඒක හරි, නමුත් ඒක හදන්න ඕනේ අපි. හරි දැන් කියන්නකෝ නිවටකමට හරි හදන්නේ දැන් ඉන්දියාව කියලා, ලැජ්ජාවක් ගැව්ලාවත් තියෙනවා නම් කියනවද ඕක එහෙම? චීනයට කියන්න තිබුණා අපි SOP එක හදනවා තව ටික දවසක් යනවා හදලා ඉවර වුණාම ඕගොල්ලට අපි කියන්නම් කියලා. මේ තේරෙන්නේ නැහ. ඒක ලැජ්ජ නැතිකම කියන්නේ “ඉන්දියාව හදනවා ඒක, ඒගොල්ලෝ හදලා ඉවර වුණාම අපි ඕගොල්ලන්ට කියන්නම්” කියලා. ඒ කියන්නේ මොනතරම් නොදියුණුකමක්ද? මොනතරම් මොනතරම් මේ මේ... ශබ්ද වචනයක් එන්නේ නෑ.

ඒ එතකොට දැන් මාළදිවයිනට තියෙනවනේ අපිට නැති හයිය. දැන් මේක හුන්ඩුවනම් නම් අරක හුණ්ඩු ගොඩක්නේ... පොඩි පොඩි දූපත් ගොඩක්. ඒක දැන් මාලදිවයිනේ තියෙනවානේ අපිට නැති හයිය, චීන ගවේෂණ යාත්‍රා මාලදිවයින භාරගන්නවනේ. අඩුගානේ දැන් මේගොල්ලෝ මේ දවස්වල පෙන්නන්නේ හැම තැනම පෝලිම් පෝලිම් කියලා, මාලදිවයිනේ පෝලිම් තියෙනවද අපි බලන්න ඕනේ. මේ අපේ ලෙවල් එකේ ළඟපාත කවුරු හරි තත්ත්වය මාලදිවයිනේ පෝලිම් නෑ. ඩුබායි අතහැරපු ඔක්කොම සල්ලිකාරයෝ ටික ඇවිල්ලා මාලදිවයිනේ දූපත් ටික අරන්. එක්කෙනෙක් මේ පැත්ත බැලුවෙත් නැහැ, බැලුවෙවත් නෑ. එතකොට දැන් ජේනවා SOP එක හදන එක දීලා තියෙන්නේ වෙන කෙනෙකුට, මාලදිවයින ඉන්නේ අපිට වඩා ඉදිරියෙන්.

දැන් මේ ආණ්ඩුව මේ කලාපයේ ආරක්ෂාවත් අවධානමට ලක් කරමින් ඉන්නවා. කලාපයේ ආරක්ෂාව දැන් මේ වෙනකොට ඇවිල්ලා තියෙනවා "ගෝර්" කියලා ඇමෙරිකානු විශේෂ නියෝජිතියෙක් ලංකාවටයි මාළදිවයිනටයි දෙකටම නියෝජිතය යනවා දවස් හතරක්. ප්‍රධාන වශයෙන් මේගොල්ලෝ බලන්නේ ලංකාවේ වරායවල් සහ ගුවන් තොටුපළවල් ඒවා වර්ධනය කළ යුතු ආකාරය. දැන් අපිට ඔය වොපර් වගයක් දෙනවානේ හෙලිකොප්ටර් වගයක්. දැන් අපිට හිතෙන්නේ හරි ෂෝක් අපිට හරි ආදරයට දෙනවා කියලා. මේ අපට ආදරයට නෙවෙයි.

ඒගොල්ලෝ මෙහෙට ඇවිල්ලා ඒගොල්ලොන්ගේ මෙහෙයුම් කටයුතු කරනකොට "වොපර්" මෙහෙ තියෙන්න ඕනේ. එහෙ ඉඳන් අරන් එන්න බැහැ, අපිට සල්ලි දීලා ගන්නත් නැහැ. ඒගොල්ලෝ ඒගොල්ලෝ පාවිච්චි කරන්න අනාගතයේ ප්ලෑන් එක තියෙන හින්දා අපිට දෙනවා දැන් වොපර්. අපිත් වොපර් මැනලා ගිහිල්ලා ගන්නවා. මේ අපිට උමනාවකට දෙන ඒවා නෙමෙයි. මේ වෙලාවේ අපිට වොපර් වෙනුවට ඉන්ධන ටිකක් දුන්නා නම් හොඳයි. අපට ඒ වොපර් ගන්නත් තෙල් නැතුව නෙමෙයි, එහෙම වෙලාවක වොපර් දෙන්නේ නෑ. ඒ ඒගොල්ලන්ගේ මැච් එකට. ඇයි අපේ ඔන්න අපි එකක් නැවැත්තුවනේ එම්සීසී (MCC), හැබැයි ඇක්සා (ACSA) තියෙනවා, ඊළඟට සෝෆා (SOFA) ගහලා තියෙනවා. ACSA එකෙන් සහ SOFA එකෙන් කරේ ඒගොල්ලොන්ගේ මිලිටරි නැව් සහ ඒ කණ්ඩායම්වලට සේවා සැපයීමේ අයිතිය අපෙන් ලබාගත්තා. දෙවෙනි එකෙන් කරගත්තා පිටු 17යි, යහපාලන ආණ්ඩුව කාලේ මංගල සමරවීර. ඒ වෙලාවේ විදේශ අමාත්‍යාංශයේ ලේකම් කවුද? එයා දැන් ඇමෙරිකාවේ පදිංචි. කරපු සේවයට... ටිරාන් දන්නවා. මංගල විදේශ ඇමති කාලේ ෆොරින් සර්විස් එකේ හිටියේ. රවිනාථ...

ඔව් ප්‍රසාද් ඒ එතකොට දැන් ඒගොල්ලෝ ඒගොල්ලෝ දැන් ඒ කරපු දේවලට දැන් ඒගොල්ලෝ හොඳට සැපට ඇමරිකාවට වෙලා ඉන්නවා. කෙසේ වෙතත් පිටු 17ක දිගු එකක් කළා අවුරුදු 10යි. 2007 පළවෙනි වතාවට කළේ පිටු දෙක තුනයි චන්ද්‍රිකාගේ ආණ්ඩු කාලය. ඒක අවුරුදු 10කින් අභාවයට යනවා, 2017 ඉවර වුණා. 2017දි කාල නියමයක් තොරව ඒ යහපාලන ආණ්ඩුවෙත් මේගොල්ලෝ සැහෙන මහන්සියක් ගත්තේ. මංගල සමරවීර කාල සීමාවක් තොරව ඒක පිටු 17ක ලියවිල්ලක් බවට පත්

කළා. ඒකට ඇතුළත් කරා හදිසි තත්ත්වයකදී ඇමෙරිකානු ආරක්ෂක හමුදා බටයින්ට සහ අනෙකුත් සියල්ලට රට අභ්‍යන්තරයේ සියලු පහසුකම් දෙන්න අපි බැඳීම ඇති කළා.

ඊළඟට ආවේ එම්සීසී (MCC) එක. එම්සීසී එක මොකක්ද? අන්න අර දෙකම කරගත්තත් වැඩක් නෑ රටේ යටිතල පහසුකම් ටික ඒ උපායමාර්ගයට අනුව හැදෙන්න ඕන. ඒ වගේ වෙලාවකදී මේ තියෙන පාරවල් හරියන්නේ නැහ, එතකොට යටිතල පහසුකම් ටික ඒ අනාගත අවශ්‍යතාවයට අනුව හැදිලා තියෙන්න ඕන. ඒ එම්සීසී එකේ තිබුණා අභ්‍යන්තර ගුවන් තොටුපළවල් 30 ගානක්. අපිට මොකටද... ජනාධිපතිතුමා කියන විදිහට හුදකලා වෙලා වගේ ඉන්න රටකට අපිට අභ්‍යන්තර ගුවන් තොටුපළවල් ඔය ගාන මොකටද? මත්තලත් කන්නද කියලානේ ඇහුවේ මේ අයියලා? දැන් මේකේ 30 ගාණක් ඇයි.

අන්න අර මිලිටරි මෙහෙයුමකදී (operation) පට පට ගාලා පාරෙන් යන්න බැහැ, පට පට ගාලා උඩින් යන්න පුළුවන් වෙන්න ඕනේ. 30 ගානක්! ත්‍රිකුණාමල වරායත් කොළඹ වරායත් එකට ඒකාබද්ධ කොට ස්පෙෂල් කොරිඩෝ එකක්. සාමාන්‍ය මිනිස්සුන්ට ඇතුළ් වෙන්න බැරි ජාත්‍යන්තර නීතිය ක්‍රියාත්මක වෙනවා. ප්‍රධාන වරායවල් දෙක දෙකට ගැට ගහලා ස්පෙෂල් කොරිඩෝ එක එම් සී සී එකේ තිබුණේ.

දැන් ඒක මහත්තයෙක් කියනවා එයා තමයි අමෙරිකාවේ ගිහිල්ලා මාසයක් විතර ඉඳලා ඊට පස්සේ මේ උදයගේ යාළුවෙක්. එයා තමයි දැන් මේ අපේ ජාතික භෞතික සැලැස්මට එම්සීසී එකේ මැප් එක දැම්මේ. මිනිහා කොච්චර කපටියෙක්ද කියනවා නම් එයා අද පාර්ලිමේන්තුවේ නැතුව කියනවා ඔය කතා කරන එක්කෙනාගේ කාලේ තමයි ඒක දැම්මෙත් කියලා, මගේ කාලේ! මම ඊට පස්සේ පොත් දෙකම ගෙනල්ලා පෙන්නුවා, මෙන්න මගේ කාලේ දාපු පොතේ ඕක නැහැ, මේ ඔයාගේ කාලේ දාපු පොතේ තමයි මේ මැප් එක තියෙන්නේ කියලා. ඇමෙරිකාවේ ගිහිල්ලා මාසයයි හිටියේ ආපු ගමන් කරේ ඔය වැඩේ. දැන් පෙන්නන්න හදනවා මම දන්නේ නැත්ද රට හිතකාමී කියලා. එයා එයා බලන්න එයා ප්‍රවර්ධනය කරනවා නේද ත්‍රිකුණාමලයේ ආශ්‍රිත සංවර්ධනයක් ගැන? ත්‍රිකුණාමල වරාය ආශ්‍රිත විශාල කතාවක් කියනවා නේද?

ඒ ඒ කතාව අරක එම්සීසී එකෙන් බැලුවේ ඒගොල්ලොන්ගේ මිලිටරි අවශ්‍යතාවට අනුකූල භෞතික සැලැස්මක් ඇති ශ්‍රී ලංකාවක් හදාගන්න. ඒක බැරි වුණා. හැබැයි අන්න දැන් ඊයේ පෙරේදා වරාය හා නාවික කටයුතු ඇමති කවුද කලින් මීඩියා එක භාරව හිටියේ? කරුණාරත්නද කවුද කියලා. මේ පාපිසිවල නම් මතක නැහැ අප්පා. ඔව්... හරි අමාරුයි නම් මතක තියාගන්න.

මේ එයා එක්ක ඇමෙරිකානු නියෝජිත කණ්ඩායමක් විශාල සාකච්ඡාවක් තියලා මේකේ යනවා ප්‍රවෘත්තිය ශ්‍රී ලංකාවේ වරායවල් සහ ගුවන් තොටුපළවල් වර්ධනය කිරීම පිළිබඳව, සංවර්ධනය කිරීම පිළිබඳව දෙරට අතර විශාල සාකච්ඡාවක් වුණා කියලා. දෙවෙනි එක, දැන් ඔය ඉරානයට ගහන්න සතියකට කලින් ආවා ඉන්දු-පැසිෆික් කලාපයේ ලොක්කා ලංකාවට මෙහෙට ආවා. දැන් හිතන්න මැද

පෙරදිග මිලිටරි තිප්පොළවල් ටික ගොඩක් ඉවරයි. දියාගෝ ගාෂියාව විතරයි මේ පැත්තෙන් ඉතුරු වෙලා තියෙන්නේ. දියාගෝ ගාෂියාවත් නඩුවකින් තීන්දු වෙලා ඉවරයි භාර දෙන්න.

බ්‍රිතාන්‍යය දැන් මේක බාර දෙන්න හදනවා, ඇමෙරිකාව භාර දෙන්න එපා කියනවා. ජාත්‍යන්තර උසාවිය තීන්දු කරලා ඉවරයි දියාගෝ ගාෂියා දෙන්න කියලා ඒ අයිති රටට, මුරුසියට. එතකොට දැන් එතන අවිනිශ්චිතයි. මැද පෙරදිග කලාපයේ ඔක්කොම මිලිටරි තිප්පොළවල් ටික ඉවරයි, ඉන්න තැනක් නෑ. නැවක ඉන්නත් බැනේ ඒකටත් ගහනවා උඩින්. දැන් හොයනවා අලුතෙන් ඉක්මනින් ඉක්මනින් පය තියන්න ඕනා තැනක්. මෙන්න තමයි තැන, නියම තැන! රතු කමිසේ දාගත්තු, දැකත්තයි මිටියයි පෙන්නගත්තු නියම ඉත්තෙක් ඉන්නවා. ඉත්තයි ඉන්න වෙලාවේ මේක තමයි අපේ තිප්පොළ වෙන්න ඕනේ.

දැන් මේ ඔය ගෝර් කියන එක්කෙනා එන්නෙත් විශේෂ නියෝජිතයා හැටියට ඒ වැඩ ටික ඉක්මන් කරවන්න. ලංකාවේ දැන් තියෙන ආණ්ඩුවෙන් ඉන්දියාව වැඩක් කරගත්තා, සැහෙන අමාරුවෙන් මහන්සි වෙලා කරගන්න වෙන්නේ. අනිත් පැත්තෙන් චීනයට කිසිම වැඩක් කරගන්න පුළුවන් කියලා මම හිතන්නේ නැහ. චීන දැන් බලන්න මේගොල්ලෝ බලශක්තිය ගැන කතා කරනවනේ. මේ බලශක්තිය තමුන් නාහන්සේලා දන්නවා අපේ එල්එන්ජී (LNG) චයිනා හාබර් සමාගම ඩොලර් මිලියන 200ක එල්එන්ජී ව්‍යාපෘතියක් ගෙනාවා ලංකාවට. එල්එන්ජී කියන්නේ ''සුනිත්‍ය බලශක්ති ප්‍රභේදයක්. මොකද කළේ? මේ ආණ්ඩුව ආවට පස්සේ ඒක කැන්සල් (cancel). ඊළඟට ගෝඨාභය රාජපක්ෂ සහ පසුව අන්තර්කාලීන ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ කාලයේ ප්‍රොසෙස් වෙමින් තිබුණා, ලෝකයේ දෙනවා මේ අපි කියමු හිරුගෙන් විදුලිය බලපදන ව්‍යාපෘති වලට බොහොම අඩු පොලී ණය. දීර්ඝ කාලීන ඒ ණය සහිත විදේශීය සමාගම් ආවා ලංකාවට විශාල පරිමාණයේ ඔය සූර්ය විදුලි බලාගාර හදන්න, ඒවා ප්‍රොසෙස් වෙමින් තිබුණා. ඒ වෙනකොට හදලා තිබ්ච්ච ඇස්තමේන්තු අනුව ඒ සමාගම් වලට අවුරුදු හයක් ඇතුළත ඒගොල්ලෝ කරපු ආයෝජනය හොයන්න පුළුවන්. ඒ විදිහට තමයි ගන්න විදුලි ඒකක මිල තීරණය කරලා තිබුණේ.

මේගොල්ලෝ ආවා බක පණ්ඩිතයෝ ටික ''ඒ ගණන් වලට බෑ ගණන් අඩු කරන්න ඕනේ'' කිව්වා. අර කලින් තිබ්ච්ච ගණන් ක්‍රමය අනුව ඒගොල්ලොන්ට අවුරුදු හයෙන් කරපු ආයෝජනය හොයන්න පුළුවන්, එතනින් එහා ලාභ. මේගොල්ලෝ ඇවිල්ලා හදපු ප්‍රතිසංශෝධිත ගණන් වලින් අවුරුදු 12ක් යනවා කරපු ආයෝජනය හොයන්න. එහෙම ඉන්නේ නැහැ කිසිම ආයෝජකයෙක්, ඒ කට්ටිය ඔක්කොම ගියා. ගියාට පස්සේ පිටිය විවෘත කළේ කාටද? ඊට පස්සේ අපිට අපේ සූර්ය විදුලි බලාගාරවලට කිව්වා ඉරිදට වහන්න කියලා. මොකක්ද ඒගොල්ලෝ කියන්නේ? "දරාගන්න බැහැ පද්ධතිය අවුල් වෙයි'' කියලා කිව්වා. එහෙම කියලා ඒක අධෛර්යය කළා. අලුතෙන් දෙන ඒවට ගාන අඩු කළා, ඒකට දෙන මිල අඩු කළා. එහෙමත් අධෛර්යය කළා. දැන් මොකද වෙන්නේ? දැන් වැඬේ හිමීට යටින් වෙනවා. එහෙමනේ ඒගොල්ලෝ කියන්නේ? අපේ ජනාධිපතිතුමා වැඬේ හිමීට යටින් යනවා කියලනේ කියන්නේ. කොහොමද හිමීට යටින් යන්නේ?

දැන් දෙන්න යනවා මේ හේලීස් ෆෙන්ටන් (Hayleys Fentons) කියන සමාගමට, ධම්මික පෙරේරා ගජමිතුරා. තව තියෙනවා එල්ටීඑල් (LTL) කියලා සමාගමක්. ඊළඟ එක තියෙනවා ''වින්ඩ්ෆෝස්'' (WindForce). වින්ඩ්ෆෝස් කියන්නේ අක්බාර්... අක්බාර් කියන්නේ හනීෆා, බස්නාහිර ආණ්ඩුකාරයා. දැන් මේ මේ සූර්ය විදුලි බලය නිපදවීමේ ව්‍යාපෘතිය අර චෞර වළල්ලත් එක්ක බැඳුණු ව්‍යාපෘතියක් බවට කරගන්නවා. මේ රටේ මිනිස්සුන්ගේ වහලවල් ටික හරියට හැදුවා නම් අද අපිට කරන්ට් කපන්න වෙනවද? හිතන්නවත් ඕන වෙනවද? අවුරුද්දක් ගියා ඒකට ඕන කරන අඩුම කුඩුම ටික කරන්න බැරිද ප්ලෑන් එකක් ඇතුව නම් ආවේ? නැතුව ආවා නම් සොරි ඩොට් කොම් තමයි. ඇතුව නම් ආවේ කරේ ඒක අධෛර්යයට පත් කරලා දැන් බලනවා ධම්මිකගෙයි හනීෆගේ ගජමිතුරන්ගේ සමාගම් ටිකට ඒ විදුලිය ඔක්කොම ටික දෙන්න.

අර එල් එන් ජී වෘත්තියත් යැව්වා. ඒ විතරක් නෙවෙයි දැන් මම අද දැක්කා අද ප්‍රවෘත්තියක්. මේකේ තියෙන්නේ රුපියල් මිලියන 2269ක් වටිනා රැහැන් ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුවක් ජේඑස්එල් ඇන්ඩ් ෆෙන්ටන්ස් (JSL & Fentons) බද්ධ ව්‍යාපාරයට දෙන්න කැබිනට් අනුමැතිය ලැබුණා කියලා. මොකක්ද මේ? ''මුල්ලි කුලම් සුළං විදුලි සම්ප්‍රේෂණ ව්‍යාපෘතියේ ලොට් ඩී යටතේ මන්නාරම ග්‍රිඩ් උප පොළේ සිට මුල්ලි කුලම් රැස් කිරීමේ ග්‍රිඩ් උප පොළ දක්වා කිලෝමීටර් 28ක් දිගින් යුත් කිලෝවෝල්ට් 220ක ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ රැහැන් මාර්ගය ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත් කරුවා'' ලෙස කවුද තෝරගෙන තියෙන්නේ?

එස් එල් එන් Fentons joint venture, වරහන් ඇතුලේ (Justalent India and Hayleys Fentons Sri Lanka. කොහොමද වැඩේ? මල්ලි ධම්මිකට රජ මගුල්! ධම්මික ජනාධිපති වෙලා මාර සල්ලියක් වියදම් කරලා හෙන කට්ටක් කාලා ජනාධිපති වෙලා ගහන්න හිතන් හිටපු මැච් එක දැන්ම කිසිම වියදමක් නැතුව පට පට ගාලා ගහගන්නවනේ. මේ මේ අලුතෙන් ආපු ජනාධිපතිගෙන්. කොහෙන් කැරකුණත් මේවට තමයි යන්නේ, කොහෙන් කැරකුණත් මේ වැඩවලට යන්නේ.

දැන් මෙහෙම උදාහරණ ඕන තරම් කියන්න පුළුවන්. දැන් බලන්න ආ තව එකක්, ඒකත් කියලා මම යන්නම්. බාල ගල් අඟුරු කතාව දැන් හැමෝම දන්නවනේ. දැන් මේ යුද්ධය නිසා නෙවෙයි මේ රටේ දැන් මේ බලශක්තිය අර්බුදයක් ඇවිල්ලා තියෙන්නේ. එහෙමනම් මාලදිවයිනෙත් පෝලිම් තියෙන්න ඕනේ. බලශක්තිය අර්බුදය ආවේ ඉරානයට ගහන්න කලින්, හෝමුස් සමුද්‍ර සන්ධිය වහන්න කලින්. වැහුවට පස්සෙත් විජිතත් පාර්ලිමේන්තුවේ කිව්වේ ''හෝමුස් වැහුවට අපිට බලපාන්නේ නැහැ අපි ගේන්නේ සිංගප්පූරුවෙන් මැලේසියාවෙන්'' කියලා. ඉතින් එහෙනම් කොහොමත් බලපාන්න විදියක් නැහැනේ. මේක ආවේ බාල ගල් අඟුරු ගේනවා ඉන්දියානු සමාගමකට දීලා. රුෂියානු තානාපතිවරයා ප්‍රසිද්ධියේ කිව්වා රුෂියාවේ කිසිම ආයෝජනයක් ලංකාව ගන්නේ නැහැ කියලා.

මම දන්නවා තොරතුරු.... අර ඕමන් සමාගමේ නේද ගල් අඟුරු කලින් තිබ්බේ? ඕමන් නැහැ රුෂියානු ගල් අඟුරු ඕමන් එකකින්නේ මම දන්න හැටියට ආවේ. හරි කමක් නැහැ. ඒක නැවැත්තුවා. ඒක

නැවැත්තුව ගමන් මම දන්න විදියට තානාපති කාර්යාලයේ නිලධාරීන් ගිහිල්ලා ඔය අදාල ඇමතිවරු හම්බවෙලා යෝජනාවක් කළා ‘‘ඕගොල්ලෝ ගවන්මන්ට් ටු ගවන්මන්ට් (G to G) ඇග්‍රිමන්ට් එකකට එන්න, ඕගොල්ලොන්ට විස්මිත මිලකට අපි අඩු මිලකට දෙන්නම් ගල් අඟුරු’’ කියලා. බාර ගත්තද? නොසලකා හැරියා. එහෙමනම් ඔය අර සමාගම මේ සමාගම ඕනේ නෑ ගවන්මන්ට් ටු ගවන්මන්ට් ඩීල් එකකට හිතාගන්න බැරි තරම් අඩු මිලකට ගල් අඟුරු ලැබෙන්න තිබුණා.

ඇයි ඒක අතහැරියේ? ඒක අතහැරපු අය නෙවෙයිද මේ අද බලශක්ති අර්බුදයට වගකියන්න ඕනේ? ඊට පස්සේ කරේ හොරා කන්න ඕනකමට බාල ගල් අඟුරු ගෙනල්ලා ඉන්දියානු සමාගමකින්. පහුගිය මාර්තු පහළොස්වෙනිදා විතරක් ඒ ප්ලාන්ට් තුනෙන් එකක මෙගාවොට් 54ක් අඩුයි උත්පාදනය කරන්න ඕන ප්‍රමාණයෙන්. අනිත් එකේ මෙගාවොට් 40ක් අඩුයි, අනිත් එකේ 38ක් අඩුයි. මෙගාවොට් 132ක් විතර අඩුයි. ඒ ඔක්කොම උපදවන්නේ දැන් ඉන්ධන වලින්. ඉන්ධන වලින් උපදවනකොට මිල වැඩියි, පිරිවැය වැඩියි.

ඉන්ධන වලින් උපදවනකොට නැවක් තනිකර නැවක් යනවා ඒ වැඩේට. එතකොට මේ හොඳට ගල් අඟුරු ගෙනාවා නම් ඉන්ධන දෙන්න ඕනේ නැහැනේ නොරොච්චෝලේ ගල් අඟුරු වෙනුවට. ඒ නැති වෙන ප්‍රමාණය ටික උපදවන්න. එතකොට මේකට කොහොමද මග ඇරලා යන්න පුළුවන්ද? දැන් කියනවා යුද්ධය නිසාලු... ඉතින් මේ.... ඒගොල්ලොන්ගේ කට්ටිය දානවා තෙල් පෝලිම් වලට... දාලා මේ මේ ඉතින් කරන්න දෙයක් නැහැනේ. එතුමාට කරන්න පුළුවන්ද.... එතුමානේ දෙවි හාමුදුරුවනේ මේකට වගකියන්න ඕනේ. මෑත කාලේ ආපු වැඩිම තෙල් මිල ඉහළම ගියේ 2022. ඒ කියන්නේ තුන්වෙනි අයට වැඩිම 2022 ජනවාරි බැරල් එකක් US ඩොලර් 89යි, පෙබරවාරි 97යි, මාර්තු 117යි. ඒ ඇවිල්ලා රුෂියානු යුක්රේන යුද්ධය පටන් ගැනීමත් එක්ක සමා වෙන්න රුෂියාවේ ආත්මාරක්ෂාව වෙනුවෙන් මෙහෙයුම පටන් ගැනීමත් එක්ක ඒ ලෝක වෙළඳ පොළේ තෙල් වලට ආපු බලපෑම. දැන් අද තාම බොරතෙල් බැරල් එකක මිල 100යි 105යි ඔය වගේ ගණන්. එතකොට එදා ගියා මාර්තු වෙනකොට 117ට. ඒ විතරක් නෙමෙයි ලෝකේ විශාලම තෙල් අපනයනකරුවෙක් රුෂියාව, ඒකට සම්බාධක දැම්මා. තිබ්බත් තෙල් දෙන්න බැරි වුණා. මේ ඔක්කොම හින්දා ආපු පීඩනය තමයි අර මිල.

හැබැයි 2022 මාර්තු ජූනි අතර බොරතෙල් (crude oil) බැරල් එකක මිල ගියා ඩොලර් 120යි කියන මට්ටමට. අද ඒ මට්ටමට තාම ගිහිල්ලා නෑ. එසේ තිබියේදීත් ඒ විතරක් නෙවෙයිනේ ඒ කම්පනය විතරක් නෙවෙයි අපි දන්නවා ප්‍රේෂණ අඩු කළා. එදා කිව්වා විදේශගත ශ්‍රමිකයන්ට සල්ලි එවන්න එපා කියලා. මාසයක් එවන්න එපා දෙකක් එවන්න එපා තුනක් එවන්න එපා ඉන්නේ ඔවුන් හොරා කනවා මේ සල්ලි වලින් කියලා. විදේශ ප්‍රේෂණ හිතා මතාම අඩු කළා. කළුකඩ ඩොලර් මාකට් එකක් හැදුවා. ඔයාලා තමයි හැදුවේ ඩොලර් මාරු කරන කළු තිප්පොළවල් හැදුවා.

ඊළඟට කොවිඩ් එකේ බලපෑම ආවා. මේ ඔක්කොමත් එක්ක ඒ ඇතිවුණු කම්පන තත්ත්වයන් අන්තිමට මේ අය විපක්ෂයේ සිටියේදී කොහොමද පාවිච්චි කළේ? විමලරත්න මහත්තයා ලැජ්ජ නැතුව

පාර්ලිමේන්තුවේ කියනවා මැට්ටෝ කියන්නේ අමු පට්ට මැට්ටෝ කියලා. මගේ හිතවතෙක් ඉන්නවලු මිනිහා ගාව දැන් මේ කොවිඩ් කාලේ ගත්තු තෙල් තාම තියෙනවලු. තෙල් එහෙම තියාගන්නත් බෑහැ, මාස තුනක් විතර තමයි මම දන්න තරමෙන් තෙල් තියාගන්න පුළුවන්. එහෙම අවුරුදු ගණන් තෙල් තියාගන්න බැහැනේ. ඒකේ මාරු වෙලා කොහොමහරි දැන් මේ යෝධයා කියනවා එයා ගාව තාම තියෙනවාලු. ඒ තමයි ඒගොල්ලෝ ගොඩගහගෙන ඉන්න කියලා පුරුදු කරපු යාළුවෝ ටික, ඔවුන් පුරුද්දට තාම ගොඩ ගහගන්නවා ඇති. ක්‍රමයෙන් මාස තුනකට වරක් ගොඩ ගහගන්නවා ඇති පුරුද්දට පක්ෂ නියෝගයක්නේ. පක්ෂයේ නියෝග නිසිපරිදි පිළිපදින්න එපැයි. අන්න ඒගොල්ලෝ වැඩ කරපු විදිය.

විගණනයෙන් ඔප්පු වෙලා තියෙනවා තෙල් බව්සර් ගිය තැනක් නෑහ කියලා. එළියට ගියාට ෂෙඩ් එකට ගිහිල්ලා නැහ. ඒ හින්දානේ අර රම්වල මහත්තයාට උපරිම සලකන්න ගියේ කථානායකකම දීලා, ඒක මේ කොහෙවත් නැති ආචාර්ය පට්ටමක් ගහගෙන වැඬේ අවුල් වුණේ. රම්වල මහත්තයා ජේවීපී (JVP) නායකත්ව ධුරාවලියේ මම ඉන්න කාලේ මධ්‍යම කාරක සභාවෙවත් හිටපු කෙනෙක් නෙවෙයි. මම ඉන්න කාලේ ඔහු ගම්පහ දිස්ත්‍රික් කමිටුවේ සාමාජිකයෙක් පමණයි. අඩු ගානේ දිස්ත්‍රික් ලේකම් කෙනෙක්වත් නෙවෙයි. ඊට අමතරව ඔහුගේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ හිටියා. එයාව ඇයි කථානායක කරන්න ගියේ? අන්න දීපු සන්තෝසම බව්සර් ටික අද්භූත ලෙස අතුරුදහන් කරවීමේ මහා ප්‍රාඥයා වූ බැවින් රන්වලට සැලකීමට සදා දුන් තනතුර තමයි කථානායක තනතුර.

ඒ යෝදයට ආචාර්ය පට්ටම හරහට හිටියා.  දැන් ඉන්නවා එකෙක් වෙන ඒවා හරහට ඉඳලා. ඒ වුණාට කරදරයක් නැහැ. මේ මනුස්සයාට ආචාර්ය පට්ටම පත්තු වෙලාවේ ඒක නැති වුණා. ඒ දුකට මිනිහා දැන් පාරේ යන්නෙත් හප්ප හප්පා. කොහොමහරි මම කියන්නේ එදා ඒ තරම් තත්ත්වයක් තිබියදී හැසිරිච්ච කට්ටිය ඒක ඉතාම පටු දේශපාලන ප්‍රයෝජන වෙනුවෙන් යොදාගන්න ගිය කට්ටිය. අද මොකද කරන්නේ? ස්පොට් ටෙන්ඩරේ (Spot Tender) දුන්නා ගල් අඟුරු වලට. දැන් බලහල්ලකෝ ස්පොට් ටෙන්ඩරේ දුන්නා පළවෙනි එක ඩොලර් 120යි. බාල ගල් අඟුරු ඒ සමාගම දෙනවා ඩොලර් 80 ගානට. දැන් ස්පොට් ටෙන්ඩරේ ඩොලර් 120ට.

ඇත්තනේ ඉතින් අර 80 ගානට දෙනවට වඩා ස්පොට් ටෙන්ඩරේ මිනිහට දීලා 120ටම ගන්නේ ඊට වඩා හොඳයිනේ. එතකොට කපන්න තියෙන ගාන තවත් කුට්ටිය වැඩියිනේ. ඒකනේ අර පොඩි කුමාරව ලොකු කුමාර විසින් හෝදන්නේ සජීවීව ඇවිල්ලා. ‘‘පොඩි කුමාර ඇමති කුමාර හැටියට වරදක් කරොත් මම පියවර ගන්නවා, පොඩි කුමාර රාජ්‍ය සේවකයෙක් හැටියට වරදක් කළොත් මම මුකුත් කරන්නේ නැහැ මම දන්නේ නෑ ඒක මම බබා’’. මම දන්නවා පැලවත්තෙන් පීඩනයක් තියෙනවා ජනාධිපතිවරයාට ඔය පොඩි කුමාරව අයින් කරන්න කියලා, ඒක නම් මම කරන්නේ නැහැ කියලා කෙලින්ම කියලා තියෙන්නේ.

කරන්න බැහැ. එකට කැවම, එකට කැවම කරන්න බෑ. කට ඇරියොත් ඉවරයි, තීරණ ගන්න බෑ. දැන් පොඩි කුමාරයාගේ ස්පොට් ටෙන්ඩරේ ගැන කතා වෙනවලු, මේ අද ඒක වාර්තා වුණේ. මේකට දුන්නොත් අපි ඉදලත් ඉවරයි ආයේ මෙයාටම දුන්නොත්, සාධාරණීකරණය කරන්න කොහෙත්ම බැරි වෙනවා. ඒ නිසා අද ගල් අඟුරු එකේ ජීඑම් (GM) ලිඛිතව දන්වලා තියෙනවා ඒ ටෙන්ඩර් එකේ හිටපු සමාගම් වලට "අපි තාවකාලිකව මේක අත්හිටෙව්වා" කියලා. අද උදේ දන්වලා තියෙනවා. දැන් මොකක්ද ඔයාලා බැලුවම දෙවෙනියට ඉන්නේ? හේලීස් ලෝකල් (Hayleys local), ධම්මික! කොහෙන් ගියත් ධම්මික! අර ඒ දවස්වල අනුර කුමාර මහත්තයා කිව්වේ පාර්ලිමේන්තුවේ 225 මොන බූරු කොළේ ඇනුවත් ඇද්දත් එන්නේ බූරුවෙක් කියලා. දැන් මේකේ මොන කොළේ ඇද්දත් ධම්මිකයි එන්නේ. හේලීස් එන්නේ.

දෙවෙනියට ඉන්නේ ධම්මික. ඒත් කුට්ටිය එයා ඩොලර් 140 ගානක්, ඉන්දියානු සමාගම ඩොලර් 120 ගාණක්. ධම්මිකගේ හේලීස් එක එයාගේ එක 140 ගානක්. කොහොමද යුද්ධය පෙන්න පෙන්න දාන සුද්ධය? මේක නෙමෙයි දැන් සුද්ධය, මේ ඉරානය පෙන්න පෙන්න ගහන සුද්ධය. කොවිඩ් කාලේ ගෝඨාභයගේ ආණ්ඩුව සුද්ධ කරයි කියලා කවුරුවත් කියනවද?

යුක්රේනය සමග රුෂියාවේ ඇතිවුණු ප්‍රශ්නයේදී ඒක පාවිච්චි කරලා සුද්ධ කළා කියලා කවුරුවත් කියනවද මේ? මේ තමයි යුද්ධය පාවිච්චි කරලා සුද්ධය හොඳටම කරන පාලනය. සුද්ධය නවත්තන්න ආපු පාලනය! ඒ නිසා අපිට පේනවා අද විදේශ ප්‍රතිපත්තිය ඉවර කරගෙන ඉවරයි, බලශක්ති සුරක්ෂිත භාවය නැති කරලා ඉවරයි. රුෂියානු තානාපතිවරයා යෝජනා කළා කුඩා පරිමාණයේ න්‍යෂ්ටික විදුලි බලාගාරයක් දෙන්නම්, අපි සල්ලි දෙන්නම් ලංකාවේ හදමු කියලා.

අපිට තියෙන්නේ අප්පු දූපත් ඔය කොහේහරි දූපතක හදන්න තිබුණානේ. අසල්වැසියෙකුට ඉන්නේ ඉන්දියාව විතරනේ, අනිත් පැති වලින් කවුරුත් අසල්වැසියෙක් නැනේ. කරන්න පුළුවන්නේනේ? ඇයි ඒවා නොකළේ? ඇමෙරිකාව ඌයිය වෙයි, ට්‍රම්පව්ව් ඌයිය වෙයි, අංකල් සෑම් ඌයිය වෙයි කියලා. ඒක හින්දා ඒවා මග හැරියේ. එතකොට ඒවා මග හැරීමේ වන්දිය ගෙවන්න ඕනේ මේ සමාජයද? ඒ වැරදි විදේශ ප්‍රතිපත්තියේ ඔලමොට්ටල අනුවණ තීරණ වල වන්දිය ගෙවන්න ඕනේ මේ සමාජයද? ලංකාවට එන්න කියලා ඒ විශ්වාසය ඇතුව ආපු නැවට ඇමෙරිකාවට ගහන්න ඉඩ හැරලා දීපු එකේ, හෙට අනිද්දා අපි නොදන්න යුද්ධවල මේ රට පැටලෙනකොට ඒකේ වන්දිය ගෙවන්න ඕනේ මේ රටේ මිනිස්සුද? ඒ නිසා අපි තේරුම් ගන්න ඕනා.

අපිව ඇදගෙන යමින් තිබෙන්නේ ඉතා භයානක දිශාවකට. ඒකට හේතුව තමයි මම අර කිව්වේ, ඔය ගෝර් මහත්තයත් දැන් ඇවිල්ලා ඉන්නේ. කලින් ඉන්දු-පැසිෆික් හමුදා ප්‍රධානියා ලංකාවට ආවේ. මේගොල්ලෝ අස්සන් කළා අපි දැනුවත්ව මොන්ටානා ඇග්‍රීමන්ට් එක. ඒකේ කොළ දෙකයි පාර්ලිමේන්තුවට දැම්මේ. දාපු කොළ දෙකේ තියෙනවා ආපදා තත්ත්වයකදී එන්න කියලා. ආපදා තත්ත්වයකදී එන්න ගිවිසුම් ගන්න ඕනේ නැහැ, අපි ආපදා තත්ත්වයකදී ඕන මනුස්සයෙක්ගෙන් උදව්

භාර ගන්නවා. එහෙම ගිවිසුම් නැතුව කලින් වුණු සුනාමි ආපදාවේදීත් ඇමෙරිකන් හමුදා ඇවිල්ලා උදව් කළා. ඒකට අමුතු ගිවිසුම් ඕනේ නැහැ. විපතේදී පිහිට වෙන්න එන කෙනාට ගිවිසුම් ඕනේ නැහැ. මෙතන නිත්‍යානුකූල දඩ ගොදුරු බිමක් බවට පත් කරගන්නයි හදන්නේ.

මැද පෙරදිග බලය නැති වෙනකොට, දියාගෝ ගාෂියා පැවැත්ම අවිනිශ්චිත වෙනකොට, ඉන්දියානු සාගර කලාපයේ තබා ගත යුතු අඩිය තබා ගත යුතු වැදගත්ම තිප්පොළ මේකයි. මෙතන අවධානම තියෙන්නේ ස්ථිර හමුදා කඳවුරු ගැන නෙමෙයි. දැන් ඇමෙරිකාව ස්ථිර හමුදා කඳවුරු ගැන එච්චර විශ්වාස කරන්නේ නැහ. දැන් තියෙන්නේ අර ''නෙළුම් කොළයෙන් නෙළුම් කොළයට'' (Lily pad) යන තියරියයි.

මේ කොළයට පනිනවා, එතන පොඩ්ඩක් ඉන්නවා, ආයේ අනිත් කොළයට පනිනවා. ඕන වෙලාවට පනින්න නෙළුම් කොළයක් හැමතැනම තියෙන්න ඕනේ. ලංකාව හදාගන්න යන්නෙත් අන්න ඒ නෙළුම් කොළය බවට පත් කරගන්න. ඒ කියන්නේ අවශ්‍යතාවය අනුව නිත්‍යානුකූලව එන්න පුළුවන්, ඇවිල්ලා ඉන්න පුළුවන්, යන්න එන්න පුළුවන්, පාවිච්චි කරන්න පුළුවන් ආයි යන්න පුළුවන්. එහෙම වෙලාවට ඒ පැටලිච්ච යුද්ධයේ මිසයිලයක් ඩෝන් ගාලා මේකට ආපුවම, එතකොට අපිට අනුර කුමාරව හොයාගන්නත් නැහ, මිනිහා කොහේ හරි වෙන රටක. රජයට පාඩු කිරීමේ චෝදනාව උදේ ගමන්තැන්න මැතිතුමා මේක ප්‍රසිද්ධියේම කියනවා, විශේෂිත උසාවි වලින් අහන නඩුවකින් හිරේ යයි. හැබැයි අනාගත පරම්පරාවේ හිස මතට තමයි මිසයිලය පතිත වෙන්න නියමිත. ඒ නිසා අපිට තියෙනවා වගකීමක්. මේ සියොන්වාදී ඇමෙරිකානු හවුලේ මිලිටරි අභිලාෂයන් වෙනුවෙන් ශ්‍රී ලංකා භූමිය යොදා ගැනීමට දරන ප්‍රයත්නයන් වළකාලීම සඳහා අධිෂ්ඨානශීලීව වැඩ කළ යුතුයි, සටන් කළ යුතුයි. ඒක වෙන කවුරුත් සඳහා නෙවෙයි.

අපේ අනාගත දූදරු පරම්පරාවන්ගේ හිස මතට නොදන්නා මිසයිලයක් පතිත වීමේ අවධානමෙන් අපේ රාජ්‍යය ආරක්ෂා කර ගැනීම අපේ යුතුකමක් සහ වගකීමක්. ඒ නිසා ආදරණීය සහෝදර සහෝදරීනි මම ඊට වඩා අදහස් ඉදිරිපත් කරන්නේ නැහැ. අපිට යුතුකමක් තියෙනවා අපේ ඉරාන සහෝදර ජනතාව වෙනුවෙන්, ඒ අයගේ සටන අපේ සටන. ඔවුන් ජීවත් වෙන්නේ හෙට උදේ ඉර එළිය බලන්න ආසාවෙන්, හෙට උදේ ගස් වල මල් පිපෙනවා දකින්න ආසාවෙන්, හෙට උදේ කුරුල්ලු කෑ ගහනවා අහන්න ආසාවෙන්. ඒ පුංචි දරුවෝ ඉස්කෝලෙට යන්නේ ඉගෙනගෙන යම් වැදගත් භූමිකාවක් ඉටු කරන රටවැසියෙක් බවට පත්වීමේ හැඟීමෙන්. ඒ හීනය දකින්න දරුවන්ට අයිතිය තිබිය යුතුයි. ඒ හීනය මරන්න සියොන්වාදී එක්සත් ජනපද නරුම හවුලට කිසිසේත්ම ඉඩ තැබිය යුතු නැහ. එයට විරුද්ධව නගන්න පුළුවන් කුමන හඬක්ද ඒකේ ප්‍රමාණය වැදගත් නැහ, ඒ හඬ නැගිය යුතුයි. යුක්ති සහගත ගෞරවාන්විත සෑම මනුෂ්‍යයෙකුටම අතහැරිය නොහැකි මනුෂ්‍ය යුතුකම එයයි. ඒ නිසා ඒ යුතුකම ඉටු කරන්න බැඳෙමු.

"බහුධ්‍රැවීය ලෝකයක් උදාවන දිනය'' නුදුරේම දැක බලාගන්නට හැකි වේවායයි ප්‍රාර්ථනා කරමි. ඩොලරයේ ආධිපත්‍යය බිඳ දැමුණු යුගයක් නුදුරේම දැක බලා ගැනීමට හැකි වේවායි ප්‍රාර්ථනාවෙන් මම

මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ඉරාන ජනතාවට විජයග්‍රහණය ලැබේවා! ලෝක සාමයට විජයග්‍රහණය ලැබේවා! බොහොම ස්තූතියි.